අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය
යුද හමුදා මූලස්ථානය
කොළඹ

බිඑෆ්/එෆ්පිඑෆ්/120/2013 (25

බෙදාහැරීම බලන්න

2013 පෙබරවාරි මස 21 දින

<u>කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පවත්වාගෙන යනු ලබන ගොවිපලවල් වලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති.</u>

යොමුව :

අ. බිඑෆ්/එෆ්පිඑෆ්/එෆ්ඒ/02/2010 (-) හා 2012.07.11 දින දරණ මෙම අම ලිපිය.

1. කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ඉදුරාම පාලනය වන ගොවිපලවල් වලට අදාලව යොමුගත ලිපිය මගින් ලබා දී ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වලට අමතරව එම ගොවිපලවල් වල ගිණුම් කටයුතු පහත දක්වා ඇති උපදෙස් අනුව 2013.01.01 දිනට එලඹෙන කාර්තුවේ සිට සිදුකල යුතු බවට මෙයින් දන්වා සිටිනු ලැබේ.

2. කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන සියළුම යුධ හමුදා ගොවිපලවල් වල ගිණුම් කටයුතු ස්වාධීනව සිදුකල යුතුය. මේ සඳහා අදාල ගෙවිපලවල් නමින් ජංගම ගිණුමක් විවෘත කර එම ගිණුම ගොවිපලට අයත් අනෙකුත් උප ගිණුම් වල බැංකුව සහ එම උප ගිණුම් වල පාලන ගිණුම වශයෙන් නඩත්තු කල යුතුය. මෙහිදී ජංගම ගිණුම පවත්වාගෙන යන ගිණුම බැංකුවක් වශයෙනුත් අනෙකුත් උප ගිණුම් බැංකුවේ ගණුදෙනුකරුවන් වශයෙන් සලකා ගිණුම් කටයුතු සිදුකල යුතු අතර, එම ගණුදෙනු සටහන් කිරීම සඳහා වෙනමම යුපො 21 හා ඒ සඳහා අවශ්‍ය අනෙකුත් පොත්පත් (උදා :- ගෙවීම් වව්චර් ගොණු, ලැබීම් වව්චර් ගොණු, විකුණුම් ඉන්වොයිස් ගොණු, ණයකරු පොත්, ණයහිමි පොත් ආදිය) යුහ ගිණුම් ප්‍රතිපත්ති/උපදෙස් වලට අනුකූලව නඩත්තු කල යුතුය.

3. කිසියම් ගොවිපලක ආයෝජන වගාවන් (උදා: තේක්ක), දිගුකාලීන නිෂ්පාදන වගාවන් (උදා: පොල් වගාව), මධ්‍ය කාලීන නිෂ්පාදන වගාවන් (උදා: පැපොල්, පේර) සහ කෙටිකාලීන නිෂ්පාදන වගාවන් (උදා:එළවළු වගාව) සිදුකරනු ලබන්නනේ නම් එම වගාවන් වෙනුවෙන් වෙනමම ගිණුම් තැබිය යුතු අතර, එම ගිණුම් උප ගිණුම් වශයෙන් හඳුනාගත යුතුය. එම උප ගිණුම් ජංගම ගිණුම පවත්වාගෙන යන (බැංකුව) ගිණුමේ ගණුදෙනුකරුවන් වශයෙන් සලකා කටයුතු කලයුතු වේ. (වගාවන් වර්ග අනුව උප ගිණුම් පවත්වාගෙන යායුතු ආකාරය පිළිබඳ වැඩිදුර උපදෙස් "10" සහ "11" ඡේදය යටතේ දක්වා ඇත). තවද ගිණුම් වර්ගීකරණය පිළිබඳ පැහැදිලි කිරීමක් මෙම ලිපියට ඇමුණුම "අ" වශයෙන් ඉදිරිපත් කර ඇත.

4. **සෑම කාර්තුවක් අවසානයේදීම එක් එක් ගොවිපල වෙතින් උපයා ඇති සමස්ථ ලාභ/අලාභයන් සහ මූල්‍ය තත්වය පෙන්වීම සඳහා ඒකාබද්ධ ලාභ අලාභ ගිණුමක් සහ ශේෂ පත්‍රයක් පිළියෙල කලයුතුය. එය පහත පරිදි සිදුකල යුතුය.**

අ. <u>ඒකාබද්ධ ලාභ අලාභ ගිණුම</u>

(1) මෙහිදී එක් එක් උප ගිණුම් වල වියදම ලෙස එම උප ගිණුම් වල සියළු විකුණුම් ගිණුම් වල "හර" පැත්තේ දෙවන එකතුවද, නඩත්තු ගිණුම් වල හර පැත්තේ දෙවන එකතුවද, පොදු ගිණුමේ වියදම ලෙස කාර්තුව තුල සිදුවූ ගනුදෙනු වල හර පැත්තේ දෙවන එකතුව (ආරම්භක ශේෂයක් තිබේනම් එය හැර) යොදාගත යුතු අතර, ආදායම ලෙස ඉහත ගිණුම් වල (පොදු ගිණුම හැර) බැර පැත්තේ දෙවන එකතුව යොදාගත යුතුය. පොදු ගිණුමේ ආදායම ලෙස ගත යුත්තේ බැර පැත්තේ ආරම්භක ශේෂය හැර දෙවන එකතුව වේ.

(2) ගොවිපල ප්‍රධාන ගිණුමේ මෙහිදී වියදම ලෙස නඩත්තු ගිණුමේ හර පැත්තේ දෙවන එකතුවද, පොදු ගිණුමේ කාර්තුව තුල සිදුවූ ගනුදෙනු වල හර පැත්තේ දෙවන එකතුව (ආරම්භක ශේෂයක් තිබේනම් එය හැර) යොදාගත යුතු අතර, ආදායම ලෙස නඩත්තු ගිණුමේ බැර පැත්තේ දෙවන එකතුව යොදාගත යුතුය. පොදු ගිණුමේ ආදායම ලෙස ගතයුත්තේ බැර පැත්තේ ආරම්භක ශේෂය හැර දෙවන එකතුව වේ.

ආ. ඒකාබද්ධ ශේෂ පත්‍රය.

(1) මේ සඳහා එක් එක් උප ගිණුම් වල හා ගොවිපල ප්‍රධාන ගිණුම වෙනුවෙන් කාර්තුව තුල පිළියෙල කල යුතුමු 12 ආකෘති පත්‍ර වල ඇතුලත් දත්තයන් යොදාගෙන එම දත්තයන් ඒකාබද්ධ කොට ගොවිපල සඳහා වූ ඒකාබද්ධ ශේෂ පත්‍රය පිළියෙල කලයුතුය. (මෙහිදි ගොවිපල ප්‍රධන ගිණුම වෙතින් සහ උප ගිණුම් වෙතින් ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් හිලව්කර පෙන්විය යුතුය).

5. කිසියම් ගොවිපලක එක් වගාවක් පමණක් සිදු කරන්නේ නම් එහි ගිණුම් කටයුතු බැංකු ගිණුමේ (ප්‍රධාන ගිණුමේ) ගිණුම් කටයුතු සිදුකරනු ලබන යුපො 21 හි සිදුකල හැකිය.

6. ප්‍රේෂණපත් මගින් ගෙවීම් සිදු කිරීම

අ. ගෙවීම් කිරීමේදි හැකි සෑම අවස්ථාවකදිම ගෙවීම් ප්‍රේෂණපත් මගින් සිදුකල යුතු අතර, එහිදි ප්‍රේෂණපත් නිළධාරීන් දෙදෙනෙකු විසින් අත්සන් කල යුතුය. ප්‍රේෂණපත් අත්සන් කිරීමේදි පළමු අත්සන ලෙස අණදෙන නිළධාරි හෝ දෙවන අණදෙන නිළධාරිගේ අත්සන යෙදිය යුතුය. දෙවන අත්සන ගොවිපල භාර නිළධාරිගේ අත්සන යෙදිය යුතුය.

ආ. කිසියම් ගොවිපලක් අණදෙන නිළධාරිවරයෙක් වෙතින් පාලනය නොවන්නේ නම් එවැනි ගිණුම් වල පලමු අත්සන නිළධාරි අණදෙන විසින්ද දෙවන අත්සන දෙවන නිළධාරි අණදෙන/ගොවිපල භාර නිළධාරි විසින් සිදුකල යුතුය.

ඇ. ගොවිපලක් අණදෙන නිළධාරිවරයෙක් යටතේ පාලනය වුවද එම ගොවිපලේ අණදෙන නිළධාරි/දෙවන අණදෙන නිළධාරි ගොවිපලට දුරස්ථ ස්ථානයක ස්ථිරව ස්ථානගතව සිටිනම් එවැනි අවස්ථාවකදි පමණක් ප්‍රේෂණපත් වල අත්සන් ඉහත ජේද අංක 6 හි උප ජේද 'ආ' අනුව සිදුකල යුතුය.

7. රු: 1000/- ට අඩු ගෙවීම් කිරීම සඳහා රු: 5000/- ක සුළු මුදල් අග්‍රිමයක් ප්‍රධාන ගිණුම යටතේ පවත්වාගෙන යා හැක. මේ සඳහා වෙනම සුළු මුදල් පොතක් නඩත්තු කල යුතුය.

8. වගා කටයුතු සඳහා ගිණුම් තුලින් වියදම් දැරීම

අ. ගොවිපලවල් වල වගා කටයුතු සඳහා අවශ්‍ය "ඒ" ගණයට අයත් දේපල (ප්‍රාග්ධන ස්වරූපයේ) එම ගිණුමේ උපයන ආදායම් තුලින් මිලදිගත යුතු අතර, එම දේපල මිලදිගැනීමට අවශ්‍ය අනුමැතිය යොමුගත ලිපියේ උපදෙස් අනුව ලබාගත යුතුය.

ආ. ගොවිපලවල් වල වගා කටයුතු සඳහා අවශ්‍ය අනෙකුත් සියළු වියදම් දැරීමේදි පහත දක්වා ඇති වියදම් සීමාව තුල වියදම් දැරීම සිදු කල යුතු අතර, මේ සඳහා නිසි පරිදි පිළියෙල කරන ලද ආකෘති පත්‍රයන් යොදාගත යුතුය.

| මුදල් සීමාව | වියදම් දැරීම සඳහා අදාල බලය |
|---|---|
| මසකට රු: 5000/- දක්වා | ගොවිපල භාර නිලධාරි |
| මසකට රු: 5000/- සිට රු: 55,000/- දක්වා | ගොවිපල අයත් අණදෙන නිලධාරි |
| මසකට රු: 55,000/- සිට රු: 100,000/- දක්වා | අධ්‍යක්ෂ කෘෂි හා පශු සම්පත් |
| මසකට රු: 100,000/- සිට රු: 160,000/- දක්වා | අධ්‍යක්ෂ අයවැය හා මුදල් පරිපාලන |
| රු: 160,000/- වඩා වැඩි | භාරකාර මණ්ඩලය |

ඇ. වගා කටයුතු සඳහා රු: 5000.00 ට වඩා වැඩි වියදම් සිදු කිරීමේදි ඒ සඳහා අවම වශයෙන් පිළිගත් ආයතන 03 කින් මිලගණන්පත් කැඳවා ගොවිපලට වැඩි ආර්ථික ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ඉහත ජේද අංක 8 'ආ' හි දක්වා ඇති අනුමැතිය මත මිලදි ගැනීම් සිදුකල යුතුය.

ඈ. වගා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය තොග වශයෙන් මිලදි ගැනීමෙන් වඩාත් වැඩි ආර්ථික ප්‍රතිලාභයක් අත්කර ගත හැකි අවස්ථාවලදි අනුමත සීමාව ඉක්මවීම වැලැක්වීම පදනම් කරගෙන එවැනි මිලදි ගැනීම් කොටස් වශයෙන් මිලදි ගැනීම සිදු නොකල යුතු අතර, එවැනි අවස්ථාවලදී අදාල අනුමත සීමාවන්ගේ අනුමැතිය මත තොග වශයෙන් අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කල යුතුය.

සුළු මුදල් අග්‍රිමයේ වියදම් සීමාව තුල දැරිය හැකි වියදම් හැර අනෙකුත් සියළු වියදම් බැංකුව (ගිණුම අයත් ජංගම ගිණුම) හරහා සිදුකල යුතුය.

වගාවන් සදහා සෘජුව හෝ වක්‍රව හදුනාගත නොහැකි වියදම් කපා හැරීම් ලෙස හදුනාගත යුතු අතර, (උදා: කිසියම් විශේෂ අවස්ථාවකදි ඉසේරෙ පිළිවෙත අනුව හඩ නිවාසයක් අළුත්වැඩියා කරගත නොහැකි අවස්ථාවන්හිදි හඩ නිවාසය අලුත්වැඩියා කිරිම වෙනුවෙන් දරණ වියදම්) එවැනි කපා හැරීම් පහත සදහන් සීමාවන් තුල සිදුකල යුතුය. මෙම කපා හැරීම් ගිණුමේ ක්‍රියාකාරීත්වයට බාධාවක් නොවන අයුරින් සිදුකල යුතුය.

| | | | |
|---|---|---|---|
| අ. | ගොවිපලට අයත් අණදෙන නිලධාරි | - | වරකට රු. 5,000.00 ක් දක්වා බැගින් කාර්තුවකට රු. 55,000.00 ක උපරිමය |
| ආ. | කෘෂි හා පසු සම්පත් අධ්‍යක්ෂ | - | වරකට රු. 10,000.00 ක් දක්වා බැගින් කාර්තුවකට රු. 60,000.00 ක උපරිමය |
| ඇ. | අධ්‍යක්ෂ අයවැය හා මුදල් පරිපාලන | - | කාර්තුවකට රු. 250,000.00 ක් උපරිමයක් දක්වා |
| ඈ. | භාරකාර මණ්ඩලය | - | රු. 250,000.00 ට වැඩි |

10. වගාවන් වර්ග හදුන්වාදිම

අ. කෘෂිකාර්මික කටයුතු අනුව වගාවන් පහත දක්වා ඇති පරිදි වර්ග 04 කට බෙදනු ලබන අතර, අවශ්‍යතාවය අනුව එම වගාවන්ගේ ස්වභාවය පරිදි අදාල වගාවන් <u>භෝග හා සත්ව</u> වගාවන් වශයෙන් වෙන්කොට හදුනාගත යුතුය.

| භෝග | | සත්ව | |
|---|---|---|---|
| (1) | ආයෝජන වගාවන් | (1) | ආයෝජන වගාවන් |
| (2) | දිගුකාලින නිෂ්පාදන වගාවන් | (2) | දිගුකාලින නිෂ්පාදන වගාවන් |
| (3) | මධ්‍ය කාලින නිෂ්පාදන වගාවන් | (3) | මධ්‍ය කාලින නිෂ්පාදන වගාවන් |
| (4) | කෙටිකාලින නිෂ්පාදන වගාවන් | (4) | කෙටිකාලින නිෂ්පාදන වගාවන් |

(අ) <u>ආයෝජන වගාවන්</u>

කෘෂිකාර්මික නිෂ්පාදනයක් (ඵලදාවන්) ලබාගත නොහැකි, දිර්ඝ කාලිනව පිරිවැය දැරීමෙන් පසු වගා කටයුතු සිදුකර එම වගාවන් විකිණිමෙන් ලාභයක් ඉපයිමේ පරමාර්ථයෙන් කරනු ලබන වගාවන් ආයෝජන වගාවන් ලෙස හදුන්වනු ලැබේ. උදා: භෝග වගාවන් - තේක්ක, නැදුන්,
සත්ව වගාවන් - විකිණිමේ පරමාර්ථයෙන් ඇතිකරන ලබන එළුවන්, ඌරන් යනාදිය.

(ආ) <u>දිගුකාලින නිෂ්පාදන වගාවන්</u>

කෘෂිකාර්මික නිෂ්පාදනයක් (ඵලදාවන්) ලබාගත හැකි ආයුකාලය අවුරුදු 3 ක් හෝ ඊට වැඩි කාලසිමාවක් පවතින වගාවන් දිගුකාලින නිෂ්පාදන වගාවන් ලෙස හදුන්වනු ලැබේ. උදා. භෝග වගාවන් - පොල් වගාව, කජු වගාව, අඹ
සත්ව වගාවන් - එළ/මි ගවයින්

(ඇ) <u>මධ්‍යකාලින නිෂ්පාදන වගාවන්</u>

කෘෂිකාර්මික නිෂ්පාදනයක් (ඵලදාවන්) ලබාගත හැකි ආයුකාලය අවුරුදු 1 ත් [illegible] 3 ක් අතර කාලසිමාවක් පවතින වගාවන් මධ්‍යකාලින නිෂ්පාදන වගාවන් ලෙස හදුන්වනු ලැබේ. උදා. භෝග වගාවන් - පැපොල්, අන්නාසි
සත්ව වගාවන් - ලේයර් කුකුලන්, විසිතුරු මල් පැල
විසිතුරු මසුන්. යනාදිය

(ඇ) කෙටිකාලීන නිෂ්පාදන වගාවන්

කෘෂිකාර්මික නිෂ්පාදනයක් (ඵලදාවන්) ලබාගත හැකි ආයුකාලය අවුරුදු 1 ක් හෝ ඊට අඩු කාලසීමාවක් පවතින වගාවන් කෙටිකාලීන නිෂ්පාදන වගාවන් ලෙස හඳුන්වනු ලැබේ. උදා. භෝග වගාවන් - එළවළු වගාව, කෙසෙල් වගාව, වී වගාව
සත්ව වගාවන් - ඉස්සන්

තවද, ආයුකාලය අවුරුදු 1 කට වඩා අඩු කාලයක් ඇති බොයිලර්ස් වගාවන් කෙටි කාලීන නිෂ්පාදන වගාවන් ලෙස සැලකිය යුතුය.

(ඉ) මෙහිදි කෘෂිකාර්මික නිෂ්පාදනයන් (ඵලදාවන්) ලෙස හඳුන්වා දි ඇත්තේ දිගු කාලීන, මධ්‍ය කාලීන හා කෙටිකාලීන වගාවන් තුලින් ලබාගන්නා නිමැවුම වේ. (උදා: පොල් ගෙඩි, බිත්තර, කිරි යනාදිය)

11. ගිණුම්කරණ පිළිවෙත

අ. ආයෝජන වගාවන්

(1) ආයෝජන වගාව නමින් උප ගිණුමක් විවෘත කර එහි ප්‍රධාන වශයෙන් ආයෝජන පිරිවැය ගිණුම සහ ආයෝජන විකුණුම් ගිණුම නමින් ගිණුම් දෙකක් විවෘත කලයුතුය. ආයෝජන පිරිවැය ගිණුම සත්‍ය ගිණුමක් වශයෙනුත් ආයෝජන විකුණුම් ගිණුම නාමික ගිණුමක් වශයෙන් හඳුනාගත යුතුය. මෙහිදි ආයෝජන වගාවන් වර්ග කිහිපයක් (උදා: භෝග වගාවන් - තේක්ක, නැදුන්, වශයෙන්) සිදුකරන්නේ නම් ඒ එක් එක් වගාවන් වෙනුවෙන් වෙන් වෙන්ව ආයෝජන පිරිවැය (තේක්ක) ගිණුම, ආයෝජන පිරිවැය (නැදුන්) ගිණුම, ආයෝජන විකුණුම් (තේක්ක) ගිණුම සහ ආයෝජන විකුණුම් (නැදුන්) නමින් වු ගිණුම් උප ගිණුම තුල පවත්වාගෙන යා යුතුය.

(2) අදාල වගාව විකුණන තෙක් දරණු ලබන සියළු වියදම් අදාල ආයෝජන පිරිවැය ගිණුම් වලට හර කල යුතුය.

(3) කාර්තුව අවසානයේදි අදාල වගාව විකුණනු නොලබන්නේ නම් එතෙක් දරණ ලද පිරිවැය අදාල ආයෝජන පිරිවැය ගිණුම් වල ශේෂය වශයෙන් ඉදිරියට ගෙන යා යුතුය.

(4) ආයෝජන වටිනාකම වෙන්වෙන් වශයෙන් හඳුනාගැනිම සඳහා ඇමුණුම 'ආ' ලෙස දක්වා ඇති ආකෘතිය අනුව එක් එක් කාණ්ඩය සඳහා වෙනමම පිරිවැය පත්‍රයක් (Cost Sheet) නඩත්තු කල යුතුය.

(5) කාර්තුව අවසානයේදි අදාල වගාව විකුණනු ලබන්නේ නම් විකිණිමෙන් ලැබෙන මුදල අදාල ආයෝජන විකුණුම් ගිණුමට බැර කර එම විකුණනු ලැබු වගාවට අදාලව දරණ ලද පිරිවැය ආයෝජන විකුණුම් ගිණුමට හර කර ආයෝජන පිරිවැය ගිණුමට බැර කල යුතුය. ඊට අනුරූපිව පිරිවැය පත්‍රිකාව යාවත්කාලීන කල යුතුය.

(6) කාර්තුව අවසානයේ ගිණුම තුලනය කිරිමේදි ආයෝජන පිරිවැය ගිණුම් වලු ශේෂ ඉදිරියට ගෙනයායුතු අතර, ආයෝජන විකුණුම් ගිණුම් තුලනය කර වෙනස ලාභ/ආලාභ ලෙස හඳුනාගෙන පොදු ගිණුමට මාරු කලයුතුය.

(7) ඒකක ප්‍රමාණය යන තිරුවෙහි ඇතුලත් විය හැක්කේ අදාල වගාවේ (පැළ/සතුන්/ඵලදාවන්, භූමි ප්‍රමාණය) ප්‍රමාණය පමණි.

## ආ. දිගුකාලීන නිෂ්පාදන වගාවන්

(1) දිගුකාලීන නිෂ්පාදන වගාව නමින් උප ගිණුමක් විවෘත කර එහි ප්‍රධාන වශයෙන් දිගුකාලීන නිෂ්පාදන පිරිවැය ගිණුම සහ දිගුකාලීන නිෂ්පාදන විකුණුම් ගිණුම නමින් ගිණුම් දෙකක් විවෘත කලයුතුය. දිගුකාලීන නිෂ්පාදන පිරිවැය ගිණුම සත්‍ය ගිණුමක් වශයෙනුත් දිගුකාලීන නිෂ්පාදන විකුණුම් ගිණුම නාමික ගිණුමක් වශයෙනුත් හඳුනාගත යුතුය. මෙහිදී දිගුකාලීන නිෂ්පාදන වගාවන් වර්ග කිහිපයක් (උදා: පොල්, කජු වශයෙන්) සිදුකරන්නේ නම් ඒ එක් එක් වගාවන් වෙනුවෙන් වෙන් වෙන්ව දිගුකාලීන නිෂ්පාදන පිරිවැය (පොල්) ගිණුම, දිගුකාලීන නිෂ්පාදන පිරිවැය (කජු) ගිණුම, දිගුකාලීන නිෂ්පාදන විකුණුම් (පොල්) ගිණුම සහ දිගුකාලීන නිෂ්පාදන විකුණුම් (කජු) නමින් වූ ගිණුම් උප ගිණුම තුල පවත්වාගෙන යා යුතුය.

(2) දිගුකාලීන නිෂ්පාදන වගාවන් වෙනුවෙන් අදාල වගාවෙන් ඵලදාව ලැබෙන තෙක් දරන ලද වියදම අදාල දිගුකාලීන නිෂ්පාදන පිරිවැය ගිණුම් වලට හර කල යුතුය. (මේ සඳහා ඇමුණුම 'ආ' ලෙස දක්වා ඇති ආකෘතිය අනුව වෙනම පිරිවැය පත්‍රිකාවක් (Cost Sheet) නඩත්තු කල යුතුය.)

(3) දිගුකාලීන නිෂ්පාදන වගාවන් (කොස් ගස්, පොල් ගස්) අලෙවි කරනු ලැබුවහොත් ඊට අදාල පිරිවැය අදාල දිගුකාලීන නිෂ්පාදන පිරිවැය ගිණුමට බැර කර, ලාභය/අලාභය තාවකාලික ගිණුමක් මගින් ගණනය කර, එම ලාභය/අලාභය පොදු ගිණුමට මාරු කල යුතුය. ඊට අනුරූපිව පිරිවැය පත්‍රිකාව යාවත්කාලීන කල යුතුය.

(4) දිගුකාලීන නිෂ්පාදන වගාවන් ඵලදාව ලබාගත හැකි තත්වයට පත්වූ පසු එම වගාවේ ඵලදායි ආයු කාලය ගණනය කර එතෙක් වගාව වෙනුවෙන් දරන ලද පිරිවැය ආයුකාලයෙන් බෙදා හායනය (ක්ෂයවීම) සරල මාර්ග ක්‍රමයට ගණනය කර එම ක්ෂය වටිනාකම දිගුකාලීන නිෂ්පාදන විකුණුම් ගිණුම් වලට හර කර දිගුකාලීන නිෂ්පාදන පිරිවැය ගිණුම් වලට බැර කලයුතුය.

(5) අදාල වගාව ඵලදාව ලබා ගත හැකි තත්වයට පත්වීමෙන් පසු දරණ ලද වියදම් අදාල දිගුකාලීන නිෂ්පාදන විකුණුම් ගිණුමට හර කල යුතුය.

(6) ඵලදාව විකිණීමෙන් ලැබෙන මුදල අදාල දිගුකාලීන නිෂ්පාදන විකුණුම් ගිණුමට බැර කලයුතුය.

(7) ඵලදාවන් වෙනුවෙන් තොග ලෙජරයක් (ප්‍රමාණය සහ වටිනාකම ඇතුලත්ව) නඩත්තු කල යුතු අතර, කාර්තුව අවසානයේදී ඵලදාවෙන් නොවිකිණි පවතින තොගය ඉතිරි තොගය වශයෙන් තොග ලෙජරයේ සහ අදාල විකුණුම් ගිණුමෙන් ඉදිරියට ගෙන යා යුතුය. මෙහිදී ඉතිරි තොගයේ පිරිවැය ගණනය කිරීමේදී අදාල කාර්තුව තුලදී වගාව වෙනුවෙන් දැරූ වියදම සම්පූර්ණ කාර්තුවේ මුළු ඵලදාවේ ප්‍රතිශතයක් ලෙස ගතයුතුය.

උදා. කාර්තුව තුලදී රු. 3000.00 ක වියදමක් දරා පොල්ගෙඩි 1000ක ඵලදාව ලැබී ඉන් 200ක් ඉතිරි වුයේ නම් ඉතිරි තොගය පහත පරිදි ගණනය කල යුතුය.
ඉතිරි තොගයේ වටිනාකම - 3000/1000 x 200 = රු. 600.00

(8) කාර්තුව අවසානයේදී ඉහත පරිදි ආදායම්/වියදම් ගිණුම්ගත කර වෙනස පොදු ගිණුමට මාරු කල යුතුය.

## ඇ. මධ්‍ය කාලීන නිෂ්පාදන වගාවන්

(1) මධ්‍ය කාලීන නිෂ්පාදන වගාව නමින් උප ගිණුමක් විවෘත කර එහි ප්‍රධාන වශයෙන් මධ්‍ය කාලීන නිෂ්පාදන පිරිවැය ගිණුම සහ මධ්‍ය කාලීන නිෂ්පාදන විකුණුම් ගිණුම නමින් ගිණුම් දෙකක් විවෘත කලයුතුය. මධ්‍ය කාලීන නිෂ්පාදන පිරිවැය ගිණුම සත්‍ය ගිණුමක් වශයෙනුත් මධ්‍ය කාලීන නිෂ්පාදන විකුණුම් ගිණුම නාමික ගිණුමක් වශයෙන් හඳුනාගත යුතුය. මෙහිදී මධ්‍ය කාලීන නිෂ්පාදන වගාවන් වර්ග කිහිපයක් (උදා: භෝග වගාවන් - පැපොල් , සත්ව වගාවන් - ලේයර්ස් වශයෙන්) සිදුකරන්නේ නම් ඒ එක් එක් වගාවන් වෙනුවෙන් වෙන් වෙන්ව මධ්‍ය කාලීන නිෂ්පාදන පිරිවැය (පැපොල්) ගිණුම, මධ්‍ය කාලීන නිෂ්පාදන පිරිවැය (ලේයර්ස්) ගිණුම, මධ්‍ය කාලීන නිෂ්පාදන විකුණුම් (පැපොල්) ගිණුම සහ

මධ්‍ය කාලින නිෂ්පාදන විකුණුම (ලේයර්ස්) නමින් වූ ගිණුම උප ගිණුම තුල පවත්වාගෙන යා යුතුය.

(2) අදාල වගාව විකුණන තෙක් දරණු ලබන සියළු වියදම් අදාල මධ්‍ය කාලින නිෂ්පාදන පිරිවැය ගිණුමට හර කලයුතුය.

(3) මධ්‍යකාලින නිෂ්පාදන වගාවන් (උදා :- ලේයර්ස්) අලෙවි කරනු ලැබුවහොත් ඊට අදාල පිරිවැය අදාල මධ්‍යකාලින නිෂ්පාදන පිරිවැය ගිණුමට බැර කර එම පිරිවැය ගිණුමෙන් ඉවත් කර ලාභය/අලාභය ගණනය කර එම අවස්ථාවේදීම පොදු ගිණුමට මාරු කල යුතුය. ඊට අනුරූපීව පිරිවැය පත්‍රිකාව යාවත්කාලීන කල යුතුය.

(4) කාර්තුව අවසානයේදී අදාල වගාව විකුණනු නොලබන්නේ නම් එතෙක් දරණ ලද පිරිවැය අදාල මධ්‍ය කාලින නිෂ්පාදන පිරිවැය ගිණුමේ ශේෂයක් වශයෙන් ඉදිරියට ගෙන යා යුතුය.

(5) ඵලදාව ලැබීම ආරම්භ කිරීමෙන් පසු දරන ලද වියදම් මධ්‍ය කාලින නිෂ්පාදන විකුණුම් ගිණුමට හර කල යුතුය.

(6) ඵලදාවන් වෙනුවෙන් තොග ලෙජරයක් (ප්‍රමාණය සහ වටිනාකම ඇතුලත්ව) නඩත්තු කල යුතු අතර, කාර්තුව අවසානයේදී ඵලදාවෙන් නොවිකිණි පවතින තොගය ඉතිරි තොගය වශයෙන් තොග ලෙජරයේ සහ අදාල විකුණුම් ගිණුමෙන් ඉදිරියට ගෙන යා යුතුය. මෙහිදී ඉතිරි තොගයේ පිරිවැය ගණනය කිරීමේදී අදාල කාර්තුව තුලදී වගාව වෙනුවෙන් දැරූ වියදම සම්පූර්ණ කාර්තුවේ මුළු ඵලදාවේ ප්‍රතිශතයක් ලෙස ගතයුතුය.

උදා. කාර්තුව තුලදී රු. 3000.00 ක වියදමක් දරා බිත්තර 1000 ක ඵලදාව ලැබී ඉන් බිත්තර 200 ක් ඉතිරි වුයේ නම් ඉතිරි තොගය පහත පරිදි ගණනය කලයුතුය.

ඉතිරි තොගයේ වටිනාකම - 3000/1000 x 200 = රු. 600.00

(7) කාර්තුව අවසානයේදී අදාල ඵලදාව විකුණනු ලබන්නේ නම් විකිණීමෙන් ලැබෙන මුදල මධ්‍ය කාලින නිෂ්පාදන විකුණුම් ගිණුමට බැර කර එතෙක් විකුණනු ලැබූ වගාවට අදාලව දරණ ලද පිරිවැය අදාල මධ්‍ය කාලින නිෂ්පාදන පිරිවැය ගිණුමට බැර කර මධ්‍ය කාලින නිෂ්පාදන විකුණුම් ගිණුමට හර කල යුතුය.

(8) මධ්‍ය කාලින නිෂ්පාදන වගාවන් කාර්තු කිහිපයක් පුරා ඵලදාව ලබා දෙන බැවින්, එම මධ්‍ය කාලින නිෂ්පාදන වගාව වෙනුවෙන් ඵලදාව ලබාදෙන තෙක් දරන ලද වියදම ඵලදාව ලබාදෙන කාර්තු අතර ක්‍රමානුකූලව බෙදාහැරිය (ක්ෂයකල) යුතුය. මෙහිදී අදාල වටිනාකම මධ්‍ය කාලින නිෂ්පාදන විකුණුම් ගිණුමට හර කර මධ්‍ය කාලින නිෂ්පාදන පිරිවැය ගිණුම බැර කල යුතුය.

(9) මධ්‍ය කාලින වගාවන් වෙන්වෙන් වශයෙන් හදුනාගැනිම සදහා ඇමුණුම 'ආ' ලෙස දක්වා ඇති ආකෘතිය අනුව එක් එක් කාණ්ඩය සදහා වෙනමම පිරිවැය පත්‍රිකාවක් (Cost Sheet) නඩත්තු කල යුතුය.

(10) කාර්තුව අවසානයේ අදාල මධ්‍ය කාලින නිෂ්පාදන විකුණුම් ගිණුම් තුලනය කර වෙනස ලාභ/පාඩු වශයෙන් හදුනාගෙන පොදු ගිණුමට මාරු කල යුතු අතර මධ්‍ය කාලින නිෂ්පාදන පිරිවැය ගිණුමේ ශේෂය ඉදිරියට ගෙන යා යුතුය.

ඇ. <u>කෙටිකාලින නිෂ්පාදන වගාවන්</u>

(1) කෙටිකාලින නිෂ්පාදන වගාව නමින් උප ගිණුමක් විවෘත කර එහි ප්‍රධාන වශයෙන් කෙටිකාලින නිෂ්පාදන පිරිවැය ගිණුම සහ කෙටිකාලින නිෂ්පාදන විකුණුම් ගිණුම නමින් ගිණුම් දෙකක් විවෘත කලයුතුය. කෙටිකාලින නිෂ්පාදන පිරිවැය ගිණුම සත්‍ය ගිණුමක් වශයෙනුත් කෙටිකාලින නිෂ්පාදන විකුණුම් ගිණුම නාමික ගිණුමක් වශයෙන් හදුනාගත යුතුය. මෙහිදී මධ්‍ය කාලින නිෂ්පාදන වගාවන් වර්ග කිහිපයක් (උදා: භෝග වගාවන් - එළවළු, වී වගාව වශයෙන්) සිදුකරන්නේ නම් ඒ එක් එක් වගාවන් වෙනුවෙන් වෙන් වෙන්ව කෙටි කාලින නිෂ්පාදන පිරිවැය (එළවළු) ගිණුම, කෙටි කාලින නිෂ්පාදන පිරිවැය

[illegible]
නිෂ්පාදන විකුණුම් (වී වගාව) නමින් වූ ගිණුම් උප ගිණුම තුල පවත්වාගෙන යා යුතුය.

(2) අදාල ඵලදාව විකුණන තෙක් දරණු ලබන සියළු වියදම් අදාල කෙටිකාලින නිෂ්පාදන පිරිවැය ගිණුමට හර කල යුතුය.

(3) කාර්තුව අවසානයේදි අදාල ඵලදාව විකුණනු නොලබන්නේ නම් එතෙක් දරණ ලද පිරිවැය අදාල කෙටිකාලින නිෂ්පාදන පිරිවැය ගිණුමේ ශේෂයක් වශයෙන් ඉදිරියට ගෙන යා යුතුය.

(4) ඵලදාව ලැබීම ආරම්භ කිරීමෙන් පසු දරන ලද වියදම් අදාල කෙටිකාලින නිෂ්පාදන විකුණුම් ගිණුමට හර කල යුතුය.

(5) ඵලදාවන් වෙනුවෙන් තොග ලෙජරයක් (ප්‍රමාණය සහ වටිනාකම ඇතුලත්ව) නඩත්තු කල යුතු අතර, කාර්තුව අවසානයේදි ඵලදාවෙන් නොවිකිණී පවතින තොගය ඉතිරි තොගය වශයෙන් තොග ලෙජරයේ සහ අදාල විකුණුම් ගිණුමෙන් ඉදිරියට ගෙන යා යුතුය. මෙහිදි ඉතිරි තොගයේ පිරිවැය ගණනය කිරීමේදි අදාල කාර්තුව තුලදි වගාව වෙනුවෙන් දැරූ වියදම සම්පූර්ණ කාර්තුවේ මුළු ඵලදාවේ ප්‍රතිශතයක් ලෙස ගතයුතුය.

උදා. කාර්තුව තුලදි රු. 3000.00 ක වියදමක් දරා ඵලවළු කි:ලෝ: 1000 ක ඵලදාව ලැබී ඉන් කි:ලෝ: 200 ක් ඉතිරි වූයේ නම් ඉතිරි තොගය පහත පරිදි ගණනය කල යුතුය.

ඉතිරි තොගයේ වටිනාකම - 3000/1000 x 200 = රු. 600.00

(6) කාර්තුව අවසානයේදි අදාල ඵලදාව විකුණනු ලබන්නේ නම් විකිණීමෙන් ලැබෙන මුදල අදාල කෙටිකාලින නිෂ්පාදන විකුණුම් ගිණුමට බැර කර එතෙක් විකුණනු ලැබූ වගාවට අදාලව දරණ ලද පිරිවැය අදාල කෙටිකාලින නිෂ්පාදන පිරිවැය ගිණුමට බැර කර කෙටිකාලින නිෂ්පාදන විකුණුම් ගිණුමට හර කල යුතුය.

(7) කෙටිකාලින නිෂ්පාදන වගාවන් කාර්තු කිහිපයක් පුරා ඵලදාව ලබා දෙන්නේ නම් එම කෙටිකාලින නිෂ්පාදන වගාව වෙනුවෙන් ඵලදාව ලබාදෙන තෙක් දරන ලද වියදම ඵලදාව ලබාදෙන කාර්තු අතර ක්‍රමානුකූලව බෙදාහැරිය යුතුය. මෙහිදි අදාල වටිනාකම කෙටිකාලින නිෂ්පාදන විකුණුම් ගිණුමට හර කර කෙටිකාලින නිෂ්පාදන පිරිවැය ගිණුම බැර කල යුතුය.

(8) කෙටිකාලින වගාවන් වෙන්වෙන් වශයෙන් හඳුනාගැනීම සඳහා ඇමුණුම 'ආ' ලෙස දක්වා ඇති ආකෘතිය අනුව එක් එක් කාණ්ඩය සඳහා වෙනමම පිරිවැය පත්‍රිකාවක් (Cost Sheet) නඩත්තු කල යුතුය.

(9) කාර්තුව අවසානයේ අදාල කෙටිකාලින නිෂ්පාදන විකුණුම් ගිණුම් තුලනය කර වෙනස ලාභ/පාඩු වශයෙන් හඳුනාගෙන පොදු ගිණුමට මාරු කල යුතු අතර කෙටිකාලින නිෂ්පාදන පිරිවැය ගිණුම් වල ශේෂ ඉදිරියට ගෙන යා යුතුය.

**12.** ගිණුම් කටයුතු වලට අදාල පොදු කරුණු

අ. වගාවන්ගේ පරිභෝජනය සඳහා ද්‍රව්‍ය මිලදි ගැනීමේදි (උදා: පොහොර, රසායනික ද්‍රව්‍ය, ඖෂධ, බීජ) ඒ වෙනුවෙන් දරණ ලද වියදම් පාරිභෝජන තොග ගිණුම නමින් ගිණුමක් විවෘත කර, එම වියදම එම ගිණුමට හර කල යුතුය. එක් එක් වගාව වෙනුවෙන් පාරිභෝජන ද්‍රව්‍ය භාවිතා කිරීමේදි එහි වටිනාකම අදාල පිරිවැය/විකුණුම් ගිණුමට හර කර එම වටිනාකම පාරිභෝජන තොග ගිණුමට බැර කල යුතුය. පාරිභෝජන ද්‍රව්‍ය වෙනුවෙන් තොග පොතක් (වටිනාකම හා ප්‍රමාණය ඇතුලත්ව) නඩත්තු කලයුතු අතර, කාර්තුව අවසානයේ ශේෂය ජංගම වත්කමක් ලෙස ඉතිරි තොගය වශයෙන් ඉදිරියට ගෙන යා යුතුය.

(ආ). වගාවන් වෙනුවෙන් දරණු ලබන වක්‍ර වියදම් හැකි සෑම විටම සමානුපාතික පදනමක් මත අදාල පිරිවැය/විකුණුම් ගිණුම් වලට හර කල යුතු අතර, එසේ සමානුපාතික පදනමක් මත හර කල නොහැකි වියදම් නඩත්තු ගිණුමට හර කල යුතුය.

පිළියෙල කරනු ලබන පිරිවැය පත්‍රිකා වෙනුවෙන් අදාල වගාව නමින් වෙන් වෙන්ව රෙජිස්ටරයන් පහත සඳහන් ආකෘති අනුව නඩත්තු කල යුතුය.

වගාවේ නම :- ..........................................................

කාලය :- 201..... ජනවාරි මස 01 දින සිට 201..... මාර්තු මස 31

| අනු අංකය | කාණ්ඩ අංකය | ආරම්භක ශේෂය රු.ශත | කාර්තුව තුල එකතු කිරීම් රු.ශත | කාර්තුව තුල ඉවත් කිරීම් රු.ශත | කාර්තුව අවසාන ශේෂය රු.ශත |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | එකතුව | | | | |

ඇ. <u>ගවයන් ගිණුම්ගත කිරිමට අදාල විශේෂ උපදෙස්</u>

(1) යුද්ධ හමුදාව ප්‍රතිපත්තිමය වශයෙන් ගවයන් මස් පිණිස නොවිකුණන බැවින් ගොවිපලවල් තුල උපදින පිරිමි සතුන් රු. 100.00 කට තක්සේරු කර එම වටිනාකම පිරිවැය ගිණුමට හර කර එම සතුන් මියගිය පසු විධිමත් පරීක්ෂණයකින් පසු එම මුදල පොත්පත් වලින් කපා හැරීමට කටයුතු කල යුතුය.

(2) පිරිමි සතුන් නඩත්තු කිරීම සඳහා දරණ වියදම නඩත්තු වියදමක් ලෙස සලකා ගිණුම්ගත කල යුතුය.

(3) ගොවිපලවල් තුල උපදින ගැහැණු සතුන් රු. 100.00 කට තක්සේරු කර එම වටිනාකම පිරිවැය ගිණුමට හරකල යුතුය.

(4) ගැහැණු සතුන්ගෙන් කිරි ලබාගන්නා තෙක් දරණ ලද වියදම් පිරිවැය ගිණුමට හරකර එම වියදම ප්‍රාග්ධනිත ගත කල යුතු අතර, කිරි ලබාගැනිම ආරම්භ විමෙන් පසු දරණ වියදම් විකුණුම් ගිණුමට හර කල යුතුය.

(5) ගැහැණු සතුන්ගෙන් කිරි ලබාගන්නා තෙක් දරණ ලද වියදම එම සතුන්ගේ වටිනාකම ලෙස සලකා එම වටිනාකම ගැහැණු සතුන්ගේ ඵලදාව ලබාගත හැකි කාලය තුල ක්ෂය කිරීමට කටයුතු කල යුතුය. මෙහිදී සතුන්ගේ නාමික වටිනාකම වන රු: 100.00 ක මුදල ක්ෂය කිරීම සඳහා නොගතයුතු අතර, රු: 100.00 වටිනාකම අදාල සතුන් මියගිය පසු විධිමත් පරීක්ෂණයකින් පසු ගිණුමෙන් කපාහැරීමට කටයුතු කල යුතුය.

(6) ගැහැණු සතුන්ගේ ඵලදාව ලබාගත නොහැකි කාලයේ සිට එම සතුන් මියයන තෙක් දරණ වියදම නඩත්තු ගිණුමට හර කිරීමට කටයුතු කල යුතුය.

(7) ගවයන් මිලදී ගැනිමේදී එම සතුන්ගේ වටිනාකම ලෙස ගැණුම් මිල ගත යුතු අතර, අනෙකුත් ගිණුම් කටයුතු ඉහත පරිදි කල යුතුය.

(8) ගොවිපල තුල උපදින ගැහැණු සහ පිරිමි සතුන් එම සතුන් උපදින අවස්ථාවේදී රු: 100.00 කට අගය කරන බැවින් එම සතුන්ගේ වටිනාකම වෙළඳපල වටිනාකමට වඩා අඩු අගයක් ගන්නා බැවින්, කිසියම් හේතුවක් මත (සතුන් නැතිවීම, කිසියම් පුද්ගලයෙකුගේ නොසැලකිල්ල මත මියයාම) එම සතුන්ගේ වටිනාකම අයකර ගැනිමට තිරණය කලහොත් එහිදී අදාල වටිනාකම ලෙස සතුන්ගේ වෙළඳපල වටිනාකම සැලකිල්ලට ගතයුතුය. වෙළඳපල වටිනාකම ගණනය කිරීම සඳහා සතුන්ගේ ජිව බර අවශ්‍ය බැවින් සෑම මාස 06 කට වරක්ම සතුන්ගේ බර මණ්ඩලයක් විසින් Weigh Band එකක් භාවිතාකර මැන බලා අදාල බර නිසි පරිදි සටහන් කළ යුතුය.

ඉ. ඉහත උපදෙස් ලබාදීමේදී ඕනෑම වගාවකින් ඵලදාව ලබාගැනීම ආරම්භ කිරීමෙන් පසු එම වගාවන්ගේ නඩත්තු කටයුතු සඳහා දරණ වියදම අදාල විකුණුම් ගිණුම් වලට හර කරන ලෙස උපදෙස් ලබාදී ඇතත් කිසියම් වගාවක ඵලදාව වර්ෂයකට එක් අවස්ථාවකදී පමණක් ලැබෙන්නේ නම් එවැනි වගාවන් නඩත්තු කිරීම වෙනුවෙන් දරණ වියදම් ඵලදාව නෙලා නොගන්නා කාර්තු වල වියදමක් ලෙස නොසලකා එම වියදම් ඉදිරියට ගෙනවිත් අස්වැන්න නෙලා ගන්නා කාර්තුවේ විකුණුම් වියදමක් ලෙස අදාල විකුණුම් ගිණුමට හර කලයුතුය. මේ සඳහා තාවකාලික පිරිවැය ගිණුමක් විවෘත කළ යුතු අතර, ගිණුම් කටයුතු පහත පරිදි කලයුතුය.

ඵලදාව නෙලන තෙක් දරණ නඩත්තු වියදම්
තාවකාලික පිරිවැය ගිණුම හර
මුදල්/බැංකු ගිණුම බැර
ඵලදාව නෙලන අවස්ථාවේදී එතෙක් තාවකාලික පිරිවැය ගිණුමේ වටිනාකම
විකුණුම් ගිණුම හර
තාවකාලික පිරිවැය ගිණුම බැර

13. කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීම.

අ. වගා කිරීමෙන් පසු ලැබෙන ඵලදාවන් අතුරින් ශ්‍රීලයුසේබ සැපයුම් බලඝණ වෙත ලබාදිය හැකි සියළුම ඵලදාවන් ශ්‍රීලයුසේබ සැපයුම් බලඝණ වෙත ලබා දිය යුතුය.

ආ. ශ්‍රීලයුසේබ සැපයුම් බලඝණ වෙත ලබාදිය නොහැකි ඵලදාවන් විවෘත වෙළඳපොල වටිනාකම, රජයේ පාලන මිල (පාලන මිලක් පවතී නම්) සහ රාජ්‍ය ආයතන තුලින් ඵලදාව මිලදීගනු ලබන්නේ නම් එම මිලගණන් සංසන්දනය කර වැඩිම ආර්ථික වාසියක් ලැබෙන පරිදි අලෙවි කිරීමට කටයුතු කල යුතුය. මෙසේ නිෂ්පාදන අලෙවි කිරීමේදී අදාල ඵලදාව මධ්‍ය කාලීන හා කෙටිකාලීන වගාවන්ට අදාල ඵලදාවක් නම් ඵලදාව අලෙවි කිරීමට ප්‍රථම ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ඒකක අණදෙන නිළධාරී හෝ ඒ වෙනුවෙන් පත් කර ඇති නිළධාරී වෙතින් ලබාගත යුතුය. අනෙකුත් සෑම වගාවකටම අදාල නිෂ්පාදන අලෙවි කිරීමට ප්‍රථම ඒ සඳහා අවශ්‍ය අනුමැතිය අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ වෙතින් ලබාගත යුතුය.

ඇ. නිෂ්පාදන අලෙවි කිරීමෙන් ලැබෙන සියළුම මුදල් ගිණුම අයත් බැංකුවේ තැන්පත් කලයුතු අතර, එම මුදල් තුලින් කිසිදු වියදමක් නොදැරිය යුතුය.

ඇ. සියළුම වගාවන් වලට අදාල අස්වනු නෙළීම මණ්ඩලයක් මගින් සිදු කල යුතු අතර, අස්වනු නෙළීමට සති තුනකට පෙර අදාල මණ්ඩල පත් කිරීම සම්බන්ධ උපදෙස් මූල්‍ය කළමනාකරණ ශාඛාව වෙතින් ලබා ගත යුතුය.

14. ලාභය බෙදාහැරීම.

අ. සෑම කාර්තුවක් අවසානයේදීම ගිණුම් තුලනය කර ලාභ අලාභ ගණනය කල යුතු අතර, එසේ ගණනය කරනු ලබන ලාභයෙන් 20 % ක් ගොවිපල කාර්ය මණ්ඩලය දිරිගැන්වීමක් වශයෙන් ඔවුන්ගේ සුභසාධන සඳහා යෙදවීමට ඒ ඒ ගොවිපලවල් වල රාජකාරියෙහි නියුතු සෙනින් අයත් ඒකක වෙත ලබාදිය යුතුය.

ආ. ලාභයෙන් ඉතිරි 80 % ක ප්‍රමාණය කළමණාකරණ කමිටුව වෙතින් තීරණය කරනු ලබන ආකාරයට ගොවිපලවල් වල ඉදිරි සංවර්ධන කටයුතු/යුද හමුදා සංවර්ධන කටයුතු/සුභසාධන කටයුතු වෙනුවෙන් යොදා ගැනීම සඳහා ගිණුමේ රඳවා ගත යුතුය.

ඇ. කිසියම් කාර්තුවක අලාභයක් සිදුවී ඇත්නම් එම අලාභය කපා හැරීමක් ලෙස නිශ්චය කරනු ලබන්නේ නම්, ඉදිරි ලාභ බෙදාහැරීමේදී එම අලාභය ආවරණය කර ගැනීමෙන් පසු ඉතිරිවන ලාභයෙන් පමණක් ලාභය බෙදාහැරිය යුතුය.

15. මුදල් ආයෝජනය කිරීම.

අ. ගොවිපලවල් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන මුදල් පමණක් ජංගම ගිණුම තුල රඳවාගෙන අතිරික්ත මුදල් ආර්ථිකමය වශයෙන් වාසිදායක වන අයුරින් කෘෂි හා පශු සම්පත්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත රාජ්‍ය බැංකු වල ආයොජනය කල යුතුය. එසේ ආයෝජනය කිරීමේදී මිල ගණන්පත් කැඳවීම් කර වැඩිම වාසිදායක බැංකුවෙහි එම මුදල් ආයෝජනය කල යුතුවේ.

16. ගිණුම් තුලනය කිරීම

අ. <u>ප්‍රධාන ගිණුම තුලනය කිරීම</u>

(1) 5 වන ජේදයේ දක්වා ඇති ආකාරයට වගාවට අදාල ගිණුම් කටයුතු ප්‍රධාන ගිණුමේ පවත්වාගෙන නොයන අවස්ථා වලදී ප්‍රධාන ගිණුම රෙආස ගිණුමක් තුලනය කරනු ලබන ආකාරය සිදුකල යුතුය. මෙහිදී තම උප ගිණුම් විසින් කාර්තුව තුල තැන්පත් කල/ආපසු ගත් මුදල් තම ආදායම/වියදම් ලෙස නොසැලකිය යුතුය.

(2) 5 වන ජේදයේ දක්වා ඇති ආකාරයට වගාවට අදාල ගිණුම් කටයුතු ප්‍රධාන ගිණුමේ පවත්වාගෙන යන අවස්ථා වලදී ප්‍රධාන ගිණුම සාමාන්‍ය උප ගිණුමක් (ආපන ශාලා ගිණුම/ බනි/සැර නිවස්න ගිණුම) තුලනය කරනු ලබන ආකාරයට තුලනය කල යුතුය.

ආ. <u>අනෙකුත් උප ගිණුම් තුලනය කිරීම</u>.
(ආයෝජන වගා, දිගුකාලින, මධ්‍ය කාලින සහ කෙටි කාලින උප ගිණුම්)

(1) මෙහිදී අදාල ගිණුම් සාමාන්‍ය උප ගිණුමක් (ආපන ශාලා ගිණුම/ බනි/සැර නිවස්න ගිණුම) තුලනය කරනු ලබන ආකාරයට තුලනය කල යුතුය.

17. ගිණුම් විගණනය කිරීම.

අ. ගොවිපලවල් පවත්වාගෙන යනු ලබන සියළුම ගිණුම් විගණනය සඳහා අවශ්‍ය වන පරිදි කාර්තුන් වශයෙන් පිළියල කලයුතුය.

ආ. විගණන මණ්ඩලය පත් කිරීම අයවැය හා මුපඅම වෙතින් සිදුකල යුතු අතර. එම ගිණුම් අනුමැතිය සඳහා කෘෂි හා පසු සම්පත් අධ්‍යක්ෂ ගේ නිර්දේශ සමගින් අයවැය හා මුපඅම වෙත ඉදිරිපත් කලයුතුය.

18. සියළුම ගොවිපලවල් වල පරිපාලන කටයුතු පිළිබඳ අධීක්ෂණය කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකල යුතු අතර, ගිණුම් කටයුතු අධීක්ෂණය අයවැය හා මුපඅම වෙතින් සිදුකල යුතුය.

19. කෘෂිකර්ම හා පසු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නව වගාවක් ආරම්භ කිරීමට අදහස් කරන්නේ නම් ඒ පිළිබඳව සක්‍යතා අධ්‍යනයක් (Feasibility Study ) සිදුකර ඒ අනුව ව්‍යාපෘති වාර්තාවක් (Project Report) පිළියල කර එම වාර්තාවන් භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කර කළමණාකරණ කමිටුවේ අනුමැතිය මත නව වගාවන් ආරම්භ කලයුතුය.

එස්කේ විරසිංහ ආර්එස්පි
මේජර් ජෙනරල්
අධ්‍යක්ෂ ජෙනරල් මූල්‍ය කළමණාකරන

<u>බෙදාහැරීම:</u>
<u>ක්‍රියාකිරීම:</u>
**මුකගා**, අවිඅම, කෘෂි හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය,
**යුහ ගොවිපල** මැනික් ෆාම්, යුහ ගොවිපල කන්දකාඩු, යුහ ගොවිපල උදයාර්කට්ටුකුලම්, යුහ ගොවිපල **නච්චිකුඩා** සහ යුහ ගොවිපල වෙල්ලම්කුලම්

<u>**දැනගැනීම:**</u>
**යුසේලේගා**

ඇමුණුම 'ආ'

කාණ්ඩ අංකය/නම: ..............................................
වගාව ආරම්භ කල දිනය: ..............................................

| දිනය | වවුචර් අංකය | වියදම් විස්තරය | ඒකක ප්‍රමාණය | වියදම් වටිනාකම | විකුණුම් පිරිවැය/ක්ෂය වටිනාකම | පිරිවැය ගිණුමට ගෙනයායුතු ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |